# ජාතක කතාවල නිර්මාණාත්මක සන්නිවේදන ලක්ෂණ

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
11 MAR 2013
UNIVERSITY OF KELANIYA

(තෝරාගත් ජාතක කතා දහයක් (10) ඇසුරින්
සිදුකළ පර්යේෂණ අධ්‍යයනයකි)

ලි:ප: අංකය - FGS/03/02/06/2000/01

එම්. ඩබ්ලිව්. නන්දන උපාලි ගුණසිංහ

ප්‍රවේශ අංකය: 796
වර්ග අංකය:

2008 මාර්තු

# සාරාංශය

ජාතක කතාවල නිර්මාණාත්මක සන්නිවේදන ලක්‍ෂණ විමර්ශනය සඳහා මෙම පර්යේෂණ අධ්‍යයනය අරමුණු ගත වේ. ජාතක කතා සුලභ පර්යේෂණ අධ්‍යයන ක්‍ෂේත්‍රයක් නිසා පර්යේෂණයේ අනන්‍යතා සීමා නිර්ණය කරගැනීම අත්‍යවශ්‍ය ය. ප්‍රවේශයක් ලෙස ජාතක කතා අර්ථ නිරූපණය කර ගැනීමත්, එහි ආරම්භය, වර්ධනය හා විකාශනය පිළිබඳවත් කරුණු දැක්වා ඇත. සන්නිවේදනය හා නිර්මාණය නිර්වචනය කර ගැනීමත්, කතා කලාව හා නිර්මාණාත්මක සන්නිවේදනය හඳුනා ගැනීමටත් මෙහි දී උත්සුක වේ. ජාතක කතාව ලාංකීය සංස්කෘතියේ බොහොමයක් අංග පෝෂණයෙහිලා බලපෑ මාධ්‍යයක් වන බැවින් එය ලංකීය සංස්කෘතිය හා වෙනත් සංස්කෘතීන් කෙරෙහි බලපා ඇති ආකාරය විමර්ශනයට ලක් කෙරේ. මෙහිදී විවිධ සාහිත්‍ය කලා ඇතුළු සංස්කෘතියේ ප්‍රමුඛාංග පෝෂණයට ජාතක කතා උපයුක්ත වී ඇති අයුරු පරීක්‍ෂාවට බඳුන්වේ.

සන්නිවේදන ක්‍රියාවලියට අදාළ සන්නිවේදකයා, මාධ්‍ය, සංදේශය, ග්‍රාහකයා සහ ප්‍රතිපෝෂණය යන මූලිකාංග බෞද්ධ සන්නිවේදනාත්මක ප්‍රවේශයකින් විග්‍රහ වේ. මෙහිදී ජාත කතාවල ඓතිහාසික, සාම්ප්‍රදායික සන්නිවේදන ආකෘතීන් මෙන්ම බෞද්ධ විමුක්ති කාමියකුගේ ප්‍රතිපත්ති පූරක භවගාමී ජීවිතය පිළිබඳ මෙම කතාවලින් සන්නිවේදිත සාම්ප්‍රදායික අන්තර්ගතය පාරමිතා ධර්ම වන බැව් ප්‍රකට කෙරේ.

තෝරාගත් ජාතක කතා දහයක් ජාතක නිමිත්ත, ජාතක කතාවේ සාරය, අන්තර්ගත විශ්ලේෂණය හා නිර්මාණාත්මක සන්නිවේදන ලක්‍ෂණ යන තේමාවන් ඔස්සේ විවරණය කරයි. ඒ සඳහා අපණ්ණක, මඛාදේව, වෙස්සන්තර, කුස, උම්මග්ග, ගණ්ඩ තින්දු, තේලපත්ත, මහාකපි, මහා උක්කුස, හා ලටුකික යන ජාතක කතා තෝරා ගැනුණි.

කාමභෝගී ජීවිත යථාර්ථය අවබෝධ කොට ඉන් අත්මිදීම උත්කෘෂ්ඨ පරිත්‍යාගය, සැබෑ ප්‍රේමය, භාවිත ප්‍රඥාව, නිරවද්‍ය උපදේශනය, පර්යේෂණය හා යහ පාලනය ශික්‍ෂිත තාරුණ්‍යයේ අධිෂ්ඨානශීලී ජයග්‍රහණය, පරෝපකාරීත්වය, සතුරු මුළු පරදවන මිත්‍රසන්ථවයේ බලය, දූරදර්ශී නැණවත් නායකත්වයේ ජයග්‍රහණ හා දුෂ්ඨ බලවේග පරාජය කළ හැකි බව අභිප්‍රේත අර්ථපද්ධතියක් මෙම උපක්‍රමශීලී සංවිධාන ශක්තිය හමුවේ, හිංසාකාරී දුෂ්ඨ බලවේග පරාජය කළ හැකි බව ආදී පොදු අර්ථ පද්ධතියක් මෙම කතා පුවත් මගින් සන්නිවේදිතය. මේ සියල්ලෙන් සමාලෝචනය කෙරෙන්නේ ජාතක කතා අපූර්ව නිර්මාණාත්මක සාර සන්නිවේදන ක්‍රමයක් බවයි. බොහොමයක් ජාතක කතාවල සන්දේශයේ අන්තර්ගත අර්ථය ලෝකයටම අදාළ පොදු ගුණාකාරයන්ගෙන් සමන්විතය. එමගින් සාර්වත්‍රික, සර්වව්‍යාපී වූ මානව සදාචාරයක් සන්නිවේදනය කෙරෙයි. සමකාලීන සමාජයේ ගැඹුරු සංකීර්ණතාවන් අවලෝකනය කිරීමට ප්‍රබල දෘෂ්ටි මානයක් නිර්මාණය වේ. පුද්ගල සන්තානගත මනෝභාවයන් ගේ සිට වාස්තවික ලෝකයේ යථාර්ථයන් ස්පර්ශ කරමින් වෙනත් නිර්මාණ මාධ්‍යන්ට මුලාශ්‍ර අනුභූතීන් සම්පාදනය කරයි. සෞන්දර්යාත්මක

රස භාවෝද්දීප්තියක් ද බුද්ධි ප්‍රභාවක් සහ ප්‍රඥා පෝෂණයක් ද සිදු කෙරේ. එය මානව සමාජය හරවත්ව දිසාගත කිරීමටත් සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමටත් උපයුක්ත වන්නා වූ විශිෂ්ඨ උත්තේජන සපයයි.

නූතන ජනමාධ්‍යකරුවාට මෙමගින් ලද හැකි ආභාසයන් බොහෝ ය. සමාජ ප්‍රගමනයට ඉවහල් වන පරිදි ස්වකීය සන්දේශ නිර්මාණය කරගන්නා ආකාරයත්, නීහර ආකාර්ශනීයත්වයන් වෙනුවට හරවත් ආනන්දයක් ගොඩනගන ආකාරයත්, ප්‍රබුද්ධ මාධ්‍ය භාවිතයකට අවශ්‍ය ප්‍රඥාවත් ශික්ෂිත භාවයත් ජාතක කතා මාධ්‍යයෙන් උකහාගත හැකිය. බුද්ධිමය පරමාර්ථයන්ගෙන් බැහැරවුණු අයාලේ යන මාධ්‍ය වැඩ සටහන්වලින් අත්මිදීමට ජාතක කතාකරුවාගෙන් ලද හැකි ආභාස බොහෝ ය. මූල්‍යමය ලාභ උත්පාදනයට ප්‍රමුඛතාව දෙමින් සමාජ සංස්කෘතික වටිනාකම් විනාශ කරන ජනමාධ්‍ය වානිජ ප්‍රචාරණාදිය සඳහා වෙන් වී ඇති කාලය මෙන්ම බටහිර යුධවාදී චින්තනය, හා රාගිකත්වය සහිත අන්තගාමී උපදේශනය, පර්යේෂණය හා යහ පාලනය ශික්ෂිත තාරුණ්‍යයේ අධිෂ්ඨානශීලී ජයග්‍රහණය, පරෝපකාරිත්වය, සතුරු මුළු පරදවන මිත්‍රසන්ථවයේ බලය, දූරදර්ශී නැණවත් නායකත්වයේ ජයග්‍රහණ හා දුෂ්ඨ බලවේග පරාජය කළ හැකි බව අභිප්‍රේත අර්ථපද්ධතියක් මෙම උපක්‍රමශීලී සංවිධාන ශක්තිය හමුවේ, හිංසාකාරී දුෂ්ඨ බලවේග පරාජය කළ හැකි බව ආදී පොදු අර්ථ පද්ධතියක් මෙම කතා පුවත් මගින් සන්නිවේදිතය. මේ සියල්ලෙන් සමාලෝචනය කෙරෙන්නේ ජාතක කතා අපූර්ව නිර්මාණාත්මක සාර සන්නිවේදන ක්‍රමයක් බවයි.